**<u>මියගිය/අතුරුදහන් හේතූන් මත ප්‍රතිලාභ මුදල් ලබා ගැනීම උපදෙස්/ පිරික්සුම්</u>**

**<u>ප්‍රතිපත්ති</u>**

- අයදුම්පත් ඉදිරිපත් කිරීමටපෙර මියගිය සාමාජිකයා නම්කර ඇති ප්‍රතිලාභීන් පිළිබඳ විස්තර ලිඛිතව යහසාධකඅම අමතා ලබාගැනීමට කටයුතුකල යුතුය.
- බැඳුනු දිනය, නැවත බැඳුණු දිනය, විශ්‍රාම ලබන දිනය, නිනොනො කාල සීමාව, සේවය අත්හිටුවා ඇත්නම් එම කාල සීමාව නිවැරදිව සඳහන් කල යුතුය.
- පෙර සිටි ඒකක හා එම ඒකකයන්හි භාවිතා කල ආධුනික අංක, රෙජි අංක සහ කාල සීමාවන් (වසර 18 සම්පූර්ණ වීමට ප්‍රථම යුද්ධ හමුදාවට බැඳී නැවත බඳවාගත් අයෙකු නම් පෙර සිටි ඒකක හා එම ඒකකයන්හි භාවිතා කල ආධුනික අංක, රෙජි අංක සහ කාල සීමාවන්) සඳහන් කල යුතුය.
- සෙසුනිළ අධිකාරියට පත්කර ඇත්නම් සෙසුනිළ අංකය හා ඒකකයෙහි විස්තර ඉදිරිපත් කල යුතුය.

**<u>කොන්දේසි හා අවශ්‍ය ලිපිලේඛන</u>**

- සෙබලාගේ උප්පැන්න සහතිකය, මියගිය සෙබලාගේ මරණ සහතිකය, ජාතික හැඳුනුම්පතෙහි සහතික කල ඡායාස්ථ පිටපත ඉදිරිපත් කල යුතුය.
- රෙජිමේන්තු මධ්‍යස්ථානයේ නඩත්තුකරනු ලබන සාමාජිකයා විසින් අවසන් වරට ප්‍රතිලාභීන් සංශෝධනය කරන ලද අයදුම්පතෙහි සහතික කල ඡායාස්ථ පිටපත ඉදිරිපත් කල යුතුය.
- මුපළ වෙතින් ලබාදී ඇති යුද්ධ හමුදාධිපති නිගමනයේ පිටපතක් ඉදිරිපත්කල යුතුය.
- අයදුම්පත අණදෙන නිලධාරී හා මධ්‍යස්ථාන සේනාවිධායක නිර්දේශයන් සමගින් අත්සන් කර නිල මුද්‍රාව තැබිය යුතුය.
- යහසාධකඅම/පා/02/06(19) හා 2023.03.14 දිනැති මෙම අම ලිපිය මගින් සියළු රෙජිමේන්තු මධ්‍යස්ථාන වෙත ඉදිරිපත් කර ඇති උපදෙස් ලිපියේ ඇමුණුම "ඉ" වෙතින් ලබාදී ඇති උපදෙස් පරිදි ක්‍රියාකලයුතු වේ.

**<u>ප්‍රතික්ෂේප වීමට හේතු</u>**

- ළදුපත හා ඥාති සම්බන්ධතා ලිපි නොමැති වීම.
- මව පියාට හිමිකම් ඇති අවස්ථාවේදී මියගිය අය විවාහ නොවූ අයෙකු නම් විවාහ නොවී ඇතිබැව් තහවුරුවක් ඉදිරිපත් කල යුතුය.
- යුද්ධ හමුදාධිපති නිගමනයෙහි අයවීමට ඇති මුදල් මෙම අම වෙතින් අයකර ගන්නා ලෙස සටහන්කර ඇති අවස්ථාවකදී ඒ සඳහා ගිණුම් විස්තර ඉදිරිපත් නොකිරීම.
- අයදුම්පත් සමග ඉදිරිපත් කරනු ලබන ලියකියවිලි පැහැදිලි නොවීම ( බැංකු පිටපත, ජාතික හැඳුණුම්පත් පිටපත, වැටුප් පත්‍රිකාව).
- වැටුප් පත්‍රිකාව අනුව බැංකු ශාඛා ගිණුම් අංක පරස්පර වීම.
- ආසන්න මාසයේ වැටුප් පත්‍රිකාව ඉදිරිපත් නොකිරීම (මාස 03කට නොවැඩි).
- දැනට යාවත්කාලීන කර ඇති නව අයදුම්පත් වෙනුවට පැරණි අයදුම්පත් ඉදිරිපත්කර තිබීම.
- අයදුම්කරුගේ ඉදිරිපත්කර ඇති නම සමග බැංකු පිටපත/ජාතික හැඳුණුම්පතේ පිටපත පරස්පර වීම.
- නැවත සේවයට බැඳුණු අයෙකු නම් එම දිනය සඳහන් නොකිරීම.
- අයදුම්පත නිවැරදිව සම්පූර්ණ කර ඒකක අණී සහතික කර නොමැති අවස්ථාවකදී.
- අයදුම්පත් සමග ඉදිරිපත්කල යුතු අනිකුත් ලියකියවිලි ඒකක අණී සහතික කර නොමැති අවස්ථාවලදී.
- අයදුම්පත සමග ඉදිරිපත් කලයුතු අනිකුත් ලියකියවිලි අමුණා නොමැති අවස්ථාවන්හිදී.
- අයදුම්පත ඉදිරිපත් කරන සාමාජිකයාගේ අත්සන පරස්පර වන අවස්ථාවලදී.